# ගොවි සංවිධාන ඇති කිරීම පිළිබඳ පර්යේෂණ අත් දැකීම් කිහිපයක්

**හැඳින්වීම**

දේශීය සහල් අවශ්‍යතාවයෙන් සියයට හැත්තෑපහකටත් වැඩි ප්‍රමාණයක් නිපදවන්නේ මෙරට සුළු ගොවීන් විසින් ය. සුළු වාරිමාර්ග යටතේ හෝ මහා වාරිමාර්ග යටතේ ජීවත් වෙමින් ජාතියේ ප්‍රධාන ආහාර වේල සපයන මෙම ගොවීන් ක්‍රමවත් ලෙස සංවිධානය වී නැතැයි කියන කථාව පිළිගත හැකි එකක් ද? ගොවීන් හට සංවිධාන අවශ්‍යම ද? ඒවා වටා රාශිභූත වීමෙන් ලබා ගත හැකි වාසි මොනවා ද? යනාදී කරුණු කීපයක් පිළිබඳව මෙම ලිපියෙන් විමසා බැලීමට අදහස් කෙරේ. මෙහිදී ගල්ඔය ගොවි සංවිධාන ව්‍යාපාරයෙන් හා අනෙකුත් පර්යේෂණ ව්‍යාපෘතිවලින් ලත් අත්දැකීම් ආශ්‍රය කොට ගෙන කරුණු විග්‍රහ කිරීමට ප්‍රයත්න දරා ඇත.

**ගොවීන් අසංවිධිත කණ්ඩායමක්ද?**

ගොවීන් සංවිධානය වී නැතැයි කීම එක හෙළාම පිළිගත හැකි දෙයක් නොවෙයි. කෘෂිකර්මය ජීවනෝපාය කර ගත් මිනිසා එඬේර යුගයේ සිටම සමූහ වශයෙන් ජීවත් වූ බව ඉතා පැහැදිලි කරුණකි. මිනිසා ස්වභාව යෙන්ම කිසියම් කණ්ඩායමකට, සමූහයකට අයත් බව හැඟවීමට විශේෂ කැමැත්තක් දක්වයි. මිනිසාට ඇතිවන ලොකුම බිය ඔහු අන්‍යයන් විසින් ප්‍රතික්ෂේප කරයිද යන්නයි. මෙම සමූහ, කණ්ඩායම් හෝ සංවිධාන විධිමත් හෝ අවිධිමත් විය හැක. එය කෙසේ වෙතත් ඒවා තුළ පොදුවේ දක්ක ගත හැකි ලක්ෂණ කීපයක් ඇත. ඒවා නම්

1. අරමුණු එකක් හෝ කීපයක් තිබීම
2. සමාන අපේක්ෂා ඇති පුද්ගලයන් පිරිසක් ඒකරාශී වීම
3. තමා එකම කණ්ඩායමක/සංවිධානයක සාමාජිකයන් යන අවබෝධය සහ බැඳීම.

සාමූහිකත්වය මත පදනම් වූ ව්‍යාප්ති යකි ගොවිතැන. සහයෝගය, එකමුතු කම, හා අන්‍යෝන්‍ය උපකාරය වර්ධනය වූ තරමට ගොවිතැන සාර්ථකව කිරීමට අවස්ථාව උදාවෙයි. ඊට අනුව ගොවීන් ගේ සංවිධානයක් නැතැයි අනුමාන කිරීම සාවද්‍ය යැයි හැඟේ. අන්තර් පරායත්ත තාවය (කෙනෙක් තව කෙනෙක් මත යැපීම) පදනම් කොට ගෙන ජීවත් වෙන ගොවීහු කිසියම් කණ්ඩායමකට සංවිධානයකට ඇතුළත් වී සාමාජිකත්වය ගැනීමෙන් පහත දක්වෙන අවශ්‍යතා ගණනාවක් ඉටු කොට ගැනීමට අපේක්ෂා කරති.

1. තමා කරගෙන යන කටයුතු සඳහා අනුමැතියක් ලබා ගැනීම
2. සමාජීය වශයෙන් පිළිගැනීමක් ලබා ගැනීමට අපේක්ෂා කිරීම
3. අනුන්ගෙන් සිදු විය හැකි අනතුරු වලින් ගැලවීම
4. තමා අනුගමනය කරන ඇගයීම් සඳහා සහයෝගය ලබා ගැනීම
5. අන්‍යයන් හා ආශ්‍රය කිරීමෙන් ප්‍රායෝගික දැනුම ලබා ගැනීම.

---

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි

**එස්. එම්. කේ. බී. නන්දරත්න විසිනි.**

---

කෘෂිකාර්මික ජන සමාජයක් ගෙන බැලීමේදී ඉහත කී අපේක්ෂාවන් ඉටු කර ගැනීම සඳහා ඔවුනොවුන් තම යුතුකම් හා වගකීම් සපුරා ලන ආකාරය පැහැදිලිව දකගත හැක. මෙම ලක්ෂණ වඩාත් හොඳින් විද්‍යාමාන වන්නේ සුළු වාරිමාර්ග යටතේ ජීවත් වෙන ගම්මුන් අතරය. ඔවුන්ගේ එම සාමාජික බැඳීම තවදුරටත් තහවුරු වීමට බලපෑ අනෙකුත් සාධකය ඥාති සම්බන්ධතාවයයි. එහෙත් විවිධ පළාත්වලින් ගෙනවුත් පදිංචි කළ නව ජනපදයක, ගොවීන් තුළින් යමහරවිට ඉහත කී අන්දමේ සමාජ බැඳීමක්, කණ්ඩායම් හැඟීමක් ඉස්මතු නොවන්නට පුළුවනි.

**සුළු වාරිමාර්ග හා ගොවි සංවිධාන**

සුළු වාරිමාර්ග යටතේ ජීවත් වෙන ගොවීන් හට රජයෙන් ලැබෙන මඟ පෙන්වීම එසේත් නැතහොත් පවත්වන සබඳතා මහා වාරිමාර්ගවලට සාපේක්ෂව ඉතා අඩු මට්ටමක පවතියි. රජයේ දෙපාර්තමේන්තුවක නිලධාරියෙක් වියළි කලාපයේ පුරාණ ගමක ගොවියෙක් දකින්නේ විශේෂ අවස්ථාවකදී පමණී. උදහරණයක් වශයෙන් නියං සහනාධාර අනුමත කිරීම, වැවේ ප්‍රතිසංස්කරණ වැඩවලදී නැතහොත් ගොවි ආරාවුලක් සමතයට පත් කිරීමේදී විය හැක. එහෙත් ගොවියෝ තමාගේ වැවත් ආරක්ෂා කොට ඇල පද්ධතියක් නඩත්තු කරමින් ගොවිතැන් වල යෙදෙති. කන්න රැස්වීම් ඇතත් නැතත් වෙල් විදනේ හා ගමරාළ සමඟ සාකච්ඡා මාර්ගයෙන් කුඹුරු වැඩ පටන් ගත යුතු වකවානුව, වැට කඩුළු ඇහිරිය යුතු කාලය, ඇල වෙලි කොටා සුද්ධ කළ යුතු කාලය හා පැල් රැකීම යනාදිය සාමූහිකව තීරණය කරති, පැහැදිලි විධිමත් සංවිධානයක් සේ දක්නට නොලැබුණත් ගමේ ප්‍රධාන වැඩ කටයුතුවලදී ක්‍රියාත්මක වන ආකාරය අනුව ක්‍රමවත් සංවිධානයකට වඩා ඉදිරියෙන් මේ අවිධිමත් සංවිධාන සිටිනවා යැයි කීම නිවැරදිය. මීට ප්‍රධාන සාධකයක් නම් පොදු වගකීම පිළිබඳ හැඟීමයි. ප්‍රජාවක් වශයෙන් ජීවත් වීමට හුරු වීම නිසා පුරාණ ගම්වල ගොවීන්ගේ ආකල්ප, හැසිරීම් සකස් වී තිබෙන්නේ ඊට ගැලපෙන ආකාරයටය. උතුරු මැද පළාතේ ගම්වල අදටත් කෙරෙන මුට්ටි නැවීම, කිරි ඉතිරවීම, ගන දෙවියෝ පිදීම ආදී උත්සව මෙම සාමූහිකත්වය තර කරන සංස්කෘතික ක්‍රියාවලින් කීපයකි.

**විපරිනාමයකට හසුවූ ග්‍රාමීය සමාජය**

පුරාණ ඇගයීම්, සමාජ බැඳීම් හා සිරිත් විරිත් ඒ ආකාරයෙන්ම අද පවත්වා ගෙන යාම දුෂ්කර කාර්යයක් බවට පත් වී තිබේ. අද ගැමියෝ පොදු අයිතියක් පිළිබඳව කථා කළහ. අද පුද්ගලික අයිතිය ඒ තැන හිමි කරගෙන තිබේ. සමාජ සංකීර්ණත්වය හා එකට අත්වැල් බැඳ ගෙන පැමිණි අපේක්ෂාවන්ගෙන්

මෙහෙයවනු ලැබූ ගැමියෝ සමාජ ඇගයීම් පසෙක තබා ආර්ථික වටිනාකමකින් යුත් දේවල් පිළිබඳව වඩාත් අවධානය යොමු කර සිටිති. මෙම ගති ලක්ෂණය සමාජ විපරිනාමයේදී නොවැලැක්විය හැකි දෙයකි. සංනිවේදන මාධ්‍ය පහසුකම් දියුණු අද වැනි යුගයක ගම හා නගරය අතර ඇති පරතරය ක්‍රමයෙන් හීනවී ගොස් නව සමාජ ඇගයීම්, ආකල්ප හා සිරිත්විරිත් ගමට සංක්‍රමණය වීම අනිවාර්යයෙන්ම දැකිය හැක. සංස්කෘතික දියුණුව පිළිබඳ අවබෝධයක් ඇති පුද්ගලයෙක් ගමට අලුතෙන් එන දෑ වැලැක්වීමට ප්‍රයත්නයක් දරන්නේ ද නැත.

ගොවියාගේ චිත්ත රටාවේ ක්‍රමික විකාශනයක්, දියුණුවක් සිදුවෙමින යන යුගයක ඔහුගේ රැකියාවේ ද (ජීවනෝපාය) නම්‍යතාවයක් ඇති විය යුතුයි. එද යැපීම සඳහා වගා කළත් අද වගාවක යෙදෙන්නේ ලාභයක් ඉපයීම අරමුණු කරගෙනය. තම පවුලේ සාමාජිකයින්ගේ ආහාර අවශ්‍යතා සම්පූර්ණ කිරීම පමණක් නොව ඇඳුම්, පැළඳුම්, නිවාස, සෞඛ්‍ය පහසුකම් සැලසීම, දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට වියදම් කිරීම, ප්‍රවාහන පහසුකම්, ඇතුළු ගෘහ උපකරණ මිල දී ගැනීම ආදී සියල්ලක් සඳහා තමාගේ ගොවිපොලෙන් ලැබෙන ආදායම යෙදවිය යුතුව ඇත. මීට අමතරව සමාජ යුතුකම් වෙනුවෙන් ද මුදල් වියදම් කිරීමට සිදු වෙයි. එහෙයින් ගොවිතැන් කටයුතුවල යෙදෙන ගොවියා තමා වියදම් කරන මුදලින් උපරිම ආදායමක් ලබා ගැනීමට ප්‍රයත්න දැරිය යුතුය. වැඩි ආදායමක් අපේක්ෂා කරන ගොවියකුට තම ගොවිතැන වඩාත් සංවිධානාත්මකව කිරීම අවශ්‍ය දෙයක් බැව් අමුතුවෙන් කිව යුතු නොවෙයි.

### නූතන කෘෂිකර්මාන්තයෙහි සංවිධානවලින් සැලසෙන සෙත

තරඟකාරී සමාජ රටාවක ජීවත් වෙමින් තරඟකාරී වෙළෙඳපොළකට භාණ්ඩ සපයන ගොවියාට පැරණි ක්‍රම පමණක්ම අනුගමනය කොට වාණිජ මට්ටමේ නිෂ්පාදනයක් කළ නොහැක. ගොවියාට අවශ්‍ය කරන නව ගොවිතැන් ක්‍රම, තාක්ෂණික දැනුම, වැඩි ආදායම් ගත හැකි භෝග වර්ග, ඇතුළු අනෙකුත් යෙදවුම් ලබා ගැනීමේදී අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනය වැනි ගැටළු රාශියකට මුහුණ පෑමට සිදු වෙයි. මේ සඳහා තිබෙන එක්තරා විකල්පයක් නම් විධිමත් සංවිධාන පිහිටුවා ගැනීමයි. ඒ මාර්ගයෙන් පෞද්ගලිකව විසඳා ගත නොහැකි ප්‍රශ්න රාශියක් සාමූහිකව විසඳා ගැනීමට අවස්ථාව සැලසේ. මේ අයුරින් විධිමත් සංවිධාන පිහිටුවා ගැනීමෙන් සැළසෙන වාසි රැසක් පහත දක්වා ඇත.

1. වගා කටයුතුවලදී දැඩි ලෙස බලපාන ජල ප්‍රශ්න විසඳා ගත හැකි වීම
2. පොහොර, රසායන ද්‍රව්‍ය, බිත්තර වී වැනි යෙදවුම් සහනදායක මිළකට ගත හැකි වීම
3. ගොවි ණය සාමූහික ක්‍රමයකට ලබා ගැනීමට ඉඩ සැලසීම
4. ජලාශය හා ඇල පද්ධතියට අදාල ප්‍රතිසංස්කරණ වැඩ සංවිධාන මඟින් නිම කළ හැකි වීම
5. ගොවි නිෂ්පාදන අලෙවියේදී සංවිධාන මැදිහත් වීමෙන් සාධාරණ මිලක් ලබා ගත හැකි වීම
6. ගොවීන්ට බලපාන පොදු ගැටළු නිලධාරීන්ගේ ක්‍රියාශීලී අවධානයට සංවිධාන මඟින් වඩා ප්‍රබලව ඉදිරිපත් කළ හැකි වීම
7. පරිපාලනමය කමිටුවලට සංවිධානවල සාමාජිකයින් නියෝජනය කරවීමේ හැකියාව හා එමඟින් රජයේ නිලධාරීන් සමඟ සමීප සබඳතා පවත්වමින් ගැටළු සඳහා විසඳුම් ලබා ගැනීමට හැකි වීම.

### සංවිධාන පිහිටුවීමේ ක්‍රියා පිළිවෙත

ගොවි සංවිධාන පිහිටුවා ගැනීමේදී වැඩි අවධානයක් ඇතැම් ගොවි ජන කොටස් කෙරේ පමණක් මෙතෙක් යොමුව ඇති බව දැකිය හැකි වුවද සංවිධාන මඟින් විවිධ අරමුණු සඳහා ගොවීන් ඒකරාශි කළ හැකි බැව් අවධාරනය කළ යුතු වේ.

මෙහිදී ප්‍රධානම වැදගත් කරුණ නම් සංවිධානයක් පිහිටුවා ගැනීමෙන් තමාට විසඳා ගත හැකි ප්‍රශ්න තිබෙනවා ද? නැද ද? යන්න සොයා බැලීමයි. වෙනත් වචනවලින් කිවහොත් සංවිධානයක අවශ්‍යතාවය කාලයක් තිස්සේ දැනුන එකක් විය යුතුය. රජයේ නිලධාරීන් නිර්දේශ කරන නිසා හෝ පෞද්ගලික ගැටළුවක් විසඳා ගැනීම සඳහා දරන ප්‍රයත්නයක් වශයෙන් හෝ සංවිධානයක් පිහිටුවා ගතහොත් එය වැඩි කල් පවත්වා ගෙන යෑම දුෂ්කර විය හැක.

පොදු අරමුණක් හෝ කීපයක් පදනම් කර ගෙන ගොවීන්ගේ වැඩි කැමැත්තට අනුව සංවිධාන පිහිටුවා ගත් පසු එය අඛණ්ඩව පවත්වා ගෙන යෑම ගැටළුවක් නොවිය හැක. පොදු ප්‍රශ්න විසඳා ගැනීම සඳහා පිහිටුවා ගනු ලබන මෙවනි සංවිධානයක නායකත්වයට භාරදූර වගකීමක්, ඉෂ්ඨ කිරීමට සිදු වෙයි. ගොවි සංවිධාන තුල ක්‍රියාත්මක විය යුත්තේ තනි නායකත්වයක් නොව සාමූහික නායකත්වයක් බව ගල්ඔය ගොවි සංවිධාන අත්දැකීම් මඟින් සනාථ වී ඇත.

සාමූහික නායකත්වයේ කාර්යභාරයන් රැසකි. ඒවා නම්,

1. තම සාමාජිකයන් කණ්ඩායමක් සේ පවත්වා ගැනීම
2. අභ්‍යන්තරව හා පරිභාහිරව පැමිණෙන තර්ජනවලට මුහුණ දීම
3. ඒකීයභාවය සහ සාමය ආරක්ෂා කිරීම
4. ගැටළු නිරාකරණය කිරීම
5. සාමාජිකයන්ගේ පොදු අරමුණු ඉෂ්ඨ කර ගැනීම සඳහා කටයුතු කිරීම
6. සාමාජිකයින්ගේ තීරණ ඉහළ නිලධාරීන්ට යොමු කිරීම සහ නිලධාරීන්ගේ තීරණ සාමාජිකයන්ට දැනුම් දීම
7. කාර්ය පහසු කරන්නෙක් එසේම සම්බන්ධීකරණය කරන්නෙක් වශයෙන් කටයුතු කිරීම
8. සාමාජිකයන්ගේ දියුණුව සැළසෙන ආකාරයේ ක්‍රියා මාර්ග ගැනීම
9. නායකත්ව ලක්ෂණ සාමාජිකයන් තුළත් ඇති කිරීමට ප්‍රයත්න දැරීම.

### ගොවීන් හා නිලධාරීන් අතර සබඳතාවය

හොඳ අරමුණු ඇති ක්‍රියාකාරී නායකත්වයක් තිබෙන සංවිධාන පිහිටුවා ගත් පමණින්ම ගොවීන්ගේ ප්‍රශ්න විසඳා ගැනීමට පුළුවන්කමක් නොමැත. රටේ පරිපාලන ක්‍රමය සකස් වී තිබෙන ආකාරයට අනුව නිලධාරීන්ගෙන් විශාල මෙහෙයක් ඉටුකරවා ගැනීමට තිබේ. ගොවීන් හා නිලධාරීන් දෙපැත්තකට වී සිටිනතාක් කල් සාර්ථක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම එතරම් පහසු නැත.

''කවුද හරි'' ''කවුද වැරදි'' යන්න සොයන වාට වඩා වැදගත් වන්නේ කිසියම් කාර්යයක් වඩාත් සාර්ථකව කළ හැක්කේ කෙසේද යන්න සොයා බැලීමයි. මෙහිදී නිලධාරීන් හා ගොවීන් අතර සබඳතාවය වැදගත් තැනක් හිමි කර ගනියි. නිලධාරීන් හට තමාගේ කටයුතු නියමිත ක්ෂේත්‍රයේ සාර්ථකව කර ගෙන යැමට ගොවි සහයෝගය අත්‍යවශ්‍ය දෙයකි. එසේම ගොවීන්ගේ ප්‍රශ්න, දුෂ්කරතාවලට විසඳුම් සෙවීමේදී නිලධාරීන්ගේ සහයෝගය හා මඟ පෙන්වීම අත්‍යාවශ්‍යය. සංවිධාන පිහිටුවා ගත් පමණින් අපි ශක්තිමත් යැයි සිතා නිලධාරීන් හා මත ගැටුම් ඇතිකර ගැනීමට ගියහොත් සංවිධාන නිසා ගොවීන් තව දුරටත් අසරණ වීමට බොහෝ ඉඩ-කඩ තිබේ. මේ නිසා දෙපාර්ශවයේම සහජීවනය සංවිධානවල අනාගත දියුණුවට මහෝපකාරී වනු ඇත.

**පර්යේෂණ අත්දැකීම්**

මෙරට මහා වාරිමාර්ග ආශ්‍රයෙන්, මිණිපේ, නාගදීප, කිඹුල්වානාඔය හා ගල් ඔය වැනි ජනපදවල ගොවි සංවිධාන වැඩ සටහන් ක්‍රියාත්මක කොට අත්හදා බැලීම් කළ බව ප්‍රකට කරුණකි. මෙම පර්යේෂණවල ප්‍රතිඵල වශයෙන් හෙළි වූ තොරතුරු අනුව බැසගත් පහත දැක්වෙන නිගමන ප්‍රයෝජනවත් වේ යැයි සිතමි.

1. ගොවීන්ගේ අවංක කැපවීම තුළින් සංවිධාන සාර්ථක කර ගත හැක.

2. නිලධාරීන්ගේ ආකල්පමය වෙනස් වීම් සංවිධාන ශක්තිමත් වීමට හේතු කාරක වී ඇත.

3. ගොවීන් හා නිලධාරීන් අතර හොඳ හිත වර්ධනය වීම තුලින් සංවිධාන වල අරමුණු කරා ළඟා වීම පහසු වී ඇත.

4. ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සාකච්ඡා මාර්ගය සුදුසු උපාය මාර්ගයක් බව තහවුරු වී ඇත.

5. ගොවීන් ගොවීන් අතර අන්‍යොන්‍ය සුහදතාවය සංවිධාන ශක්තිය තර වීමට ඉවහල් වී ඇත.

6. ජල පාලනය පිළිබඳ සංවිධාන මඟින් ජලය ඉවත් කිරීම, බෙදා හැරීම, මුර ක්‍රම, ක්‍රියාත්මක කිරීම වඩාත් කාර්යක්ෂමව සිදුකොට ඇත.

7. ගොවීන් අතරින් සුදුසු පුද්ගලයන් නායකයන් වශයෙන් සම්මුති යෙන් පත්කර ගැනීමට පුරුදුවී ඇත.

8. වාරිමාර්ග පද්ධති කළමණාකරණයේදී ගොවි සහභාගිත්වයේ ඇති වැදගත්කම ගොවියෝ මෙන්ම නිලධාරීන් ද අවබෝධ කරගෙන ඇත.

9. කෙත් ඇල කණ්ඩායම්, බෙදුම් ඇළ සංවිධාන ආදී වශයෙන් පිහිටුවා ගෙන වාරිමාර්ග පද්ධතිය ක්‍රමානුකූලව නඩත්තු කිරීම පහසු වී ඇත.

10. ගොවීන් තුල කුශලතා, හොඳ හිත දියුණු වෙන ආකාරයේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ගොවීන් ජල කළමණාකරණය සඳහා දක්වන උනන්දුව වැඩි වී ඇත.

11. ජාති භේද, වර්ග භේද, පක්ෂ භේද වලින් තොරව සැම දෙනාම ගොවියෝ යන හැඟීමෙන් එක මුතුව ජීවත් වීමට යෝග්‍ය ආකල්පමය වෙනසක් සිදුවීමට ගොවි සංවිධාන දායක වී ඇත.

අවසාන වශයෙන් මෙතෙක් දැක්වූ කරුණු සමස්ථයක් වශයෙන් ගත්කළ එළඹිය හැකි නිගමන කීපයක් මෙසේ කෙටියෙන් සඳහන් කළ හැක. එදා පුරාණ ගම්වල පැවති ආකාරයේ මානව සංවිධිත සමාජ පද්ධතියක් ගැන අද කථා කළ නොහැක. සමාජ විපරිනාමයත් සමඟ සංකීර්ණත්වයට පැමිණි මිනිස් අවශ්‍යතා නිසා ගොවිජන ජිවිතය වෙනස්වීම්වලට ලක් වෙමින් ඉදිරියට ගමන් කිරීමට පටන් ගෙන ඇත. සංවිධානය, කළමණාකරණය හා සම්පත් කාර්යක්ෂමතාවයකින් යුතුව පාවිච්චි කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු වී ඇති මේ යුගයේ ගොවීන්ගේ ජීවනෝපාය සාර්ථක කර ලීමට සංවිධානවලින් ඉතා වැදගත් මෙහෙයක් ඉටු කළ හැක. පැහැදිළි අරමුණක් ඇතිව පිහිටුවා ගත් සංවිධානවලට සැබෑ නායකත්වයක් සහ නිලධාරී සහාය උපරිම අන්දමින් ලබා ගත හොත් සංවිධානවල සාර්ථකත්වය පිළිබඳව ගැටළුවක් මතු නොවෙයි. පක්ෂ දේශපාලනයෙන් තොර, පෞද්ගලිකත්වය බැහැර කළ සංවිධාන මඟින් ගොවි ජනතාවට උපරිම සේවයක් සිදු කිරීමට ඇති ඉඩකඩ බොහෝය. ගොවි සංවිධානවලින් කිසියම් සේවයක් බලාපොරොත්තු වීමට නම් ''සංවිධාන ජනතාව සඳහා මිස ගොවිජනතාව සංවිධාන සඳහා නොවේ'' යන්න තහවුරු විය යුතුය. ඒ හැර ග්‍රාමීය මට්ටමේ ගොවි ජනතාව තුළ සැබෑ නායකත්ව ලක්ෂණ පහළ වීමට නම් ගොවීන් හට ඔවුන්ගේ කුශලතා සහ සහජ හැකියාවන් දියුණු කර ගැනීමට නිලධාරීන්ගේ සහය ද අත්‍යවශ්‍ය වේ.



සාර්ථක කෘෂිකර්මාන්තයේ පදනම සාමූහිකත්වයයි.